# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2196/4 - 2020 ඔක්තෝබර් මස 05 වැනි සඳුදා - 2020.10.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

යොමු අංකය : DIV/MW/LND/3/1/2-7
ඉඩම් අමාත්‍යාංශයේ ගොනු අංකය : 4-3/16/2017/PT/270.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තරය:*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මාවතගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගන්දහය කෝරළේ සුළු කොට්ඨාසයේ අංක 653, පරගහදෙණිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පරගහදෙණිය ගමේ පිහිටි කුරුණෑගල දිස්ත්‍රික් මැණුම් අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක අ. ග. පි. 1107 හා 2020.05.20 දිනැති පිඹුරේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0127ක් පමණ වූ ඉඩම් කොටස

කැබලි අංක 1
**ඉඩමේ නම: කනට්ගොල්ලවත්ත, බඩහැලකොටුවවත්ත; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: සාදිකුල් මුනව්වරා අසීස් නිසාම්; ප්‍රමාණය: හෙක්. 0.0127**

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020 නොවැම්බර් මස 11 වැනි දින පෙ. ව. 10.00 ට මාවතගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද 2020 නොවැම්බර් මස 04 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ඩී. පී. එස්. කුමාර,
ප්‍රාදේශීය ලේකම් හා අත්පත් කර ගැනීමේ නිලධාරි
මාවතගම.

2020 සැප්තැම්බර් මස 30 වැනි දින,
මාවතගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10 -772


1A - G 33039 – 10 (2020/10)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*